# දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## <u>දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ තක්සේරු කාර්යයන් සඳහා</u>

## <u>ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවය ලබා ගැනීම</u>

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ තක්සේරු කාර්යයන් සඳහා මාස 06ක කාලයකට ගිවිසුම්ගතව තක්සේරු **පරීක්ෂක නිලධාරීන් 04** දෙනකු ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීමට අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරනු ලබන අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රම මිලදී ගැනීම්-තක්සේරු පරීක්ෂක"** ලෙස සඳහන් කර **<u>2024.08.02</u>** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලුපාර, දෙහිවල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අදාල අයදුම්පත්‍රය <u>www.dmmc.lk</u> යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක)

1. තනතුර - **තක්සේරු පරීක්ෂක** (ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත)
2. වැටුප් ප්‍රමාණය - **දිනකට රු. 2,500/- බැගින්**

3. අධ්‍යාපන සුදුසුකම් -

**I.** **ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමනාකරණය හා තක්සේරු විද්‍යාව පිළිබඳ උපාධිය ලබා තිබීම.**

**හෝ**

**ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරුකරණය පිළිබඳ පාඨමාලාව සමත්වීම.**

**හා**

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවම වශයෙන් මාස 06ක පළපුරුද්දක් තිබිය යුතුය.**

**II.** **රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, තක්සේරු පරීක්ෂක සේවයේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරියෙක්/ නිලධාරිනියක වීම. (2024.08.02 දිනට වයස අවුරුදු 67 නොඉක්මවිය යුතුය.)**

4. වෙනත් සුදුසුකම් -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
III. වයස අවු.18ට වැඩි විය යුතු අතර අවු. 67 නොඉක්මවිය යුතුය.
IV. බස්නාහිර පළාත තුල පදිංචිකරුවන් පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ.
V. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

5. බඳවා ගැනීමේ ක්‍රමය - **<u>සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත්ව සේවය සඳහා බඳවාගනු ලැබේ.</u>**

I. සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරා ගැනීම සිදු කෙරේ.
II. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
III. ගිවිසුමට එළඹීමට පෙර, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් නියම කරනු ලැබුවහොත් ඇප කොන්දේසි වලට යටත්ව රු. 10,000/-ක ඇපයක් තැබීමට ඔබ බැඳී සිටිය යුතුය.
IV. දිනකට අවම පැය 08ක කාලයක් සේවයේ යෙදිය යුතුය.
V. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුය.
VI. මසක් තුළ ඔබ වැඩ කරන දින ගණන සඳහා අදාල දීමනාව ඊළඟ මස 10 වන දිනට පෙර ගෙවීම් කරනු ලබයි.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අදාල සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

එම්.එම්.සී.කේ.කේ.මාන්නප්පෙරුම
නාගරික කොමසාරිස් සහ බලතල, කාර්යය
කර්තව්‍ය ඉටුකිරීමේ නිලධාරි
දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව
ගාලු පාර, දෙහිවල.
**2024.07.12**